# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2079/5 - 2018 ජූලි මස 09 වැනි සඳුදා - 2018.07.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය:* 4/1/5/26.
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ යොමු අංකය :* 4-3/9/2015/WS/126.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 837, කුරුණෑගල නගරය බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ. (කුරුණෑගල මහ නගර සීමාව තුළ කොට්ඨාස අංක 11) මඩමේගම ගමේ පිහිටි සර්වේයර් ජෙනරාල් විසින් 2018.05.01 දිනැතිව මැන සකස් කරන ලද, අංක කු/2396 දරන මූලික පිඹුරේ කැබලි අංක 1 හා කැබලි අංක 2 වශයෙන් දැක්වෙන "දන් ගහ කුඹුර" සහ "ගලගාව කුඹුර" නැමැති ඉඩමෙන්, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0119ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් දෙක.

**කැබලි අංක 01 - ඉඩමේ නම: දන්ගහ කුඹුර සහ ගලගාව කුඹුර; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: මුල් හිමිකම් පාන්නා නොදනී; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0017**

*උතුරට* : මූලික පිඹුරු අංක කු/60හි 2 වැනි බිම් කැබැල්ල; *නැගෙනහිරට*: මෙම පිඹුරේ 2 වැනි බිම් කැබැල්ල; *දකුණට*: මෙම පිඹුරේ 2 වැනි බිම් කැබැල්ල; *බටහිරට*: මූලික පිඹුරු අංක කු/60 හි 2 වැනි බිම් කැබැල්ල.

**කැබලි අංක 02 - ඉඩමේ නම: දන්ගහ කුඹුර සහ ගලගාව කුඹුර; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනයන්: ටී. ජේ. පී. සිල්වා මහතා, අංක 315 'සිරිසර', කොළඹ පාර, කුරුණෑගල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0102**

*උතුරට*: මූලික පිඹුරු අංක කු/60 හි 2 වැනි බිම් කැබැල්ල; *නැගෙනහිරට*: ටී. ජේ. පී. සිල්වා හිමිකම් කියන දන්ගහමුල කුඹුර සහ ගලගාව කුඹුර; *දකුණට*: ටී. ජේ. පී. සිල්වා හිමිකම් කියන දන්ගහමුල කුඹුර සහ ගලගාව කුඹුර; *බටහිරට*: මෙම පිඹුරේ 1 වැනි බිම් කැබැල්ල සහ මූලික පිඹුරු අංක කු/60 හි 2 වැනි බිම් කැබැල්ලෙන් කොටසක්.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 අගෝස්තු මස 06 වැනි දින පෙ. ව. 10.00 ට කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2018 ජූලි මස 30 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත

පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

ආර්. එම්. එම්. එස්. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම් ,
කුරුණෑගල.

2018 ජූනි මස 20 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කුරුණෑගල.

07– 766

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය:* KEG/LAN/AQUIS/A3/1/104.
*ඉඩම් අමා. අංකය :* 4-3/15/2016/VE/239.

කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 2016 නායයාමෙන් අවතැන් වූ ජනතාව නැවත පදිංචි කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම පාරඹේවත්ත දංදෙනිය කොටස නැමති ඉඩම අමුණා ඇති උපලේඛනයේ සඳහන් ඉඩම් කැබලි අත්පත්කර ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වෙනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇරැගම ග්‍රාම නිලධාරි වසමේ ඇරැගම ගම තුල පිහිටි කෑගල්ල මැනුම් අධිකාරිගේ අංක මු. පි. කෑ. 3574 දරන මුලික පිඹුරේ අමුණා ඇති උපලේඛනයේ සඳහන් ඉඩම් කැබලි 02ක් වේ.

*වන්දි හිමිකම් පරීක්ෂණ දින*

මු. පි. කෑ. 3574 පිඹුරේ කැබලි 02 සඳහා අගෝස්තු 13 වැනි දින පෙ. ව. 9.30ට

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ ඉහත සඳහන් දිනයන්හි හා වේලාවන්හිදී කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2018 ජූලි මස 23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් අත්පත් කර ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එච්. ටී. ආර්. නාලිකා පියසේන,
ප්‍රාදේශීය ලේකම්/ඉඩම් අත්කර
ගැනීමේ නිලධාරී,
කෑගල්ල.

2018 ජූලි මස 04 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කෑගල්ල.

උපලේඛනය

මු. පි. කෑ. 3574

**කැබලි අංක 01 - ඉඩමේ නම: පාරඹේ වත්ත-දංදෙනිය කොටස; ප්‍රමාණය: හෙක්ටයාර් 1.4808**

මායිම් විස්තරය :

*උතුරට*: ලියනහේන මූකලාන, පාරඹේ වත්ත (දංදෙනිය කොටස) සහ ලියන්හේන; *නැගෙනහිරට* හා *දකුණට* : මාර්ගය; *බටහිරට* : මාර්ගය හා ලියන්හේන මූකලාන.

**කැබලි අංක 02 - ඉඩමේ නම: පාරඹේ වත්ත-දංදෙනිය කොටස; ප්‍රමාණය: හෙක්ටයාර් 1.0262**

මායිම් විස්තරය :

*උතුරට*: ලියනහේන මූකලාන සහ මාර්ගය; *නැගෙනහිරට* : මාර්ගය සහ පාරඹේවත්ත (දන්දෙනිය කොටස); *දකුණට*: පාරඹේවත්ත (දන්දෙනිය කොටස) සහ මාර්ගය; *බටහිරට* : මාර්ගය හා අතුරුපාන ගම් මායිම.

හිමිකම් පාන්නාගේ නම හා ලිපිනය

01. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,
    කොළඹ

02. කළමනාකරණ අධ්‍යක්ෂ,
    කෑගල්ල වැවිලි සමාගම,
    අංක 310, හයිලෙවල් පාර, නාවින්න.
    මහරගම.

07-767

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.